# පරිසරවේදියා 2024

## ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ

### 1. වැඩ සටහනේ අරමුණ

ජාතික විද්‍යා පදනම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයකි. ජාතික විද්‍යා පදනම විසින් 2021 වසරේ සිට 1-6 වසර දරුවන් අරමුණු කොට ළමා පරිසරවේදියා වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අධ්‍යාපන අංශය හා ප්‍රාථමික අංශය සමග එකතුව වාර්ෂිකව සිදුකරයි. මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ පාසල් දරුවන් පරිසරය සමග ක්‍රියාකාරකම් වලට යොමු කිරීම සහ පරිසරයට ආදරය කරන, පරිසරය සුරැකීමට දායක වන වගකීම් සහිත අනාගත පරපුරක් බිහිකිරීමයි.

### 2. වැඩසටහන සඳහා දරුවන් යොමු කළ යුතු ආකාරය

මෙම වැඩසටහනේ මූලික ක්‍රියාකාරකම වන්නේ දරුවෙකුට තමා ජීවත් වන පරිසරයේ හෝ පාසල් අවට පරිසරයේ යම්කිසි තෝරාගත් පරිසර සාධකයක්/ ජීවියෙක්/ ශාකයක් පිළිබඳව සති 06ක නියමිත කාල රාමුවක් තුළ නිරීක්ෂණය කර වාර්තා කර ගැනීම සහ තමාගේ නිරීක්ෂණ ආශ්‍රිතව පරිසර දින පොතක් (Natural journal) පිළියෙල කිරීමයි. පරිසර දිනපොත සැකසීම සඳහා සති 02 ක කාලයක් ලබා දෙන අතර මුළු ව්‍යාපෘති කාලය සති 08 කි.

**සැලකිය යුතුයි : මෙම අධ්‍යයනය සඳහා නිවසේ සුරතලයට ඇති කරන සතුන්, මල් පැළ වැනි දේ යොදා ගැනීමෙන් වළකින්න.**

### 3. පරිසර අධ්‍යයනයට යොදාගත හැකි ව්‍යාපෘති සඳහා - උදාහරණ කිහිපයක්

1. දරුවන්ට තම ගෙවත්තට පැමිණෙන කුරුල්ලන් නිරීක්ෂණය කළ හැක. එක් විශේෂයක් පමණක් තෝරාගෙන ඔවුන්ගේ හැසිරීම, ආහාර සොයා යාමේ පුරුදු (උදා: පොළොව මත ඇති ආහාර සොයාගැනීම, දඩයම් කර ආහාර සොයා ගැනීම ආදිය ), ආහාර සොයාගැනීම සඳහා ඔවුන්ගේ ශරීරය හැඩගැසී ඇති ආකාරය (උදා: හොටය, පාදය, බෙල්ල ආදී ) රංචු ගැසීම (රැළක්, යුගලක් හෝ හුදෙකලාව ජීවත්වීම) ආදිය නිරීක්ෂණය කර වාර්තා කිරීම සිදු කළ හැක. මෙම සතුන්ගෙන් පරිසරයට ඇති ප්‍රයෝජන හෝ හානි සොයා බැලීමට ද දරුවාට මග පෙන්වන්න.

2. අවට පරිසරයේ ඇති ඖෂධීය ශාකයක් හෝ පලතුරක් / වෙනත් ශාකයක් දරුවාට හඳුන්වා දෙන්න. ඉන්පසු ඒවා වැඩෙන පරිසරය, එහි ස්වභාවය, එය පඳුරක් ද, වැලක් ද යන්න මල් ගෙඩි

හට ගන්නා ආකාර හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ ආදිය වාර්තා කිරීමට ඉඩ සලස්වන්න. දිනපතා ශාකයේ සිදුවන වෙනස්කම් ඒ ආශ්‍රිතව ගැවසෙන සතුන් පිළිබඳව අධ්‍යයනය කරන්න. එහි ඖෂධීය වටිනාකම ආහාරයක් ලෙස යොදා ගත හැකිද යන්න පිළිබඳ තොරතුරු සොයා බැලීමට යොමු කරන්න. කුඩා පැලැටියක් නම් පැළැටියම ද නැතහොත් ශාක කොටස්ද වියළා අලවා ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු පොත් පත් මගින්, වැඩිහිටියෙකුගෙන් හෝ අන්තර්ජාලයේ විශ්වාසදායක වෙබ් අඩවි ආශ්‍රිතව ලබා ගැනීමට උපකාර කරන්න.

3. දරුවාට ගෙවත්තේ ඇති කෘමීන් වර්ගයක් තෝරා ගෙන (උදා කුහුඹුවන්, මකුළුවන්, කුරුමිණියන්, සමනලුන් ආදිය) නිරීක්ෂණය කිරීමට යම් කාලයක් ලබා දෙන්න. එමෙන්ම අත් කාචයක් භාවිතයෙන් සමීපව නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. සතුරන්ගෙන් ආරක්ෂා වීමට ස්වභාවිකව ඔවුන් සකස් වී ඇති ආකාරය (සලබයන්, කෘමීන් පරිසරය සමඟ ජීවත් වීමට දක්වන අනුවර්තන) වාසස්ථාන සැකසීමට කටයුතු කරන ආකාරය (කුහුඹු ජනපදය) නිරීක්ෂණය කිරීමට යොමු කිරීම, පරිසරය හා දක්වන අනුවර්තන, වර්ණ රටා ආදිය නිරීක්ෂණය කර වාර්තා කර ගැනීමට යොමු කරන්න. මෙහිදී එක් සත්ව විශේෂයක් නිරීක්ෂණය සඳහා යොදා ගැනීම වඩා පුළුල් අධ්‍යයනයකට මග පාදයි.

4. ගෙවත්තට එන සතුන් (උදා: ලේනුන්, කටුස්සන්, වඳුරන්, මුගටියා ආදී සතුන්) නිරීක්ෂණය කර ඔවුන්ගේ ආහාර ගැනීමේ පුරුදු, පෙනුම, ඔවුන් ආහාර සොයන ආකාරය ආදිය නිරීක්ෂණය කිරීමට දරුවන් යොමු කරන්න. ඔවුන් වත්තට ඇතුළු වන වේලාවන් හැසිරෙන ආකාරය අධ්‍යයන කරන්න. මෙහිදී මෙවැනි එක් සතෙකුගේ හැසිරීම් රටාව නිරීක්ෂණය කිරීම සෑහේ. තෝරාගත් සතාගේ වර්ගය, විශේෂය, පිළිබඳව පොත පත ආශ්‍රිතව සොයා බලා අධ්‍යයනය කිරීමට දරුවාට උපකාර කරන්න. මොවුන්ගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජන වගා හානි පිළිබඳව අධ්‍යයනයට දරුවා යොමු කරන්න.

5. දිවා කාලයේදී අහසේ වලාකුළු වල ස්වභාවය අධ්‍යයනය කිරීමට දරුවා යොමු කරන්න. වර්ෂාවකට පෙර හෝ පසු විවිධ වලාකුළු රටා කාලය සමග වෙනස් වීම් නිරීක්ෂණය කර වාර්තා කිරීමට දරුවා යොමු කරන්න. අන්තර්ජාලය හෝ වෙනත් තොරතුරු භාවිතා කර වළාකුළු හැඩ හා අදාල තොරතුරු පිළිබඳව දරුවා දැනුවත් කිරීමට කටයුතු කරන්න. විශේෂ දිනවලදී (උදා වැසි දින) යොදාගත් වේලාවන් වලට අමතරව වේලාවන්හි ද නිරීක්ෂණය සිදු කිරීමෙන් පරිසර වාර්තාවට අගය එකතු වීමක් සිදුවේ. රාත්‍රීකාලයේදී අහස නිරීක්ෂණය කිරීමේදී තරුරටා චන්ද්‍රයාගේ වෙන්වීම් ආදිය නිරීක්ෂණයට යොමු කරන්න. (සැ.යු. වර්ෂාකාලයෙදී මෙවැනි ක්‍රමාණුකූල නිරීක්ෂණයන් අපහසු බැවින් වර්ෂාකාලවලදී එවැනි ව්‍යාපෘතියක් තොරාගැනීම දරුවාගේ අධ්‍යනයට බාධාවක් වනු ඇත).

## 4. අධ්‍යයනය සඳහා දරුවාට මග පෙන්විය හැකි ආකාරය

1. නිරීක්ෂණය කළ යුතු යම් වස්තුවක් හඳුනා ගැනීමට දරුවාට සහාය වීම සහ නිරීක්ෂණ සඳහා කාල සටහනක් සැකසීම (උදා. උදේ 6, සවස 4). විශේෂ අවස්ථාවලදී අමතර කාලවලදීද නිරීක්ෂණය සිදු කිරීමට යොමු කරන්න. දිනය, වේලාව සමග සියලු අධ්‍යයනයන් සිදුකළ

ආකාරය, යොදාගත් උපකරණ, ලබාගත් නිරීක්ෂණ පිළිබඳව සටහන් පවත්වා ගැනීමට දරුවාව යොමු කරන්න.

2. පරිසර නිරීක්ෂණ කටයුතු සිදු කිරීමේදී සෑම විටම දරුවාගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වන්න
3. ජාතික විද්‍යා පදනම මඟින් පරිසරය පිළිබඳ දේශන මාලාවක් 2024 ජුනි /ජූලි මාස තුල සංවිධානය කරනු ඇත. ජාතික විද්‍යා පදනමේ නිල YouTube නාලිකාව සහ නිල Facebook පිටුවට සම්බන්ධවීමෙන් මේ පිළිබඳ වැඩි දුර විස්තර ලබා ගත හැක . (https://www.youtube.com/channel/UCWziS21LQ1L9xSDUZAKD5dw)
4. දරුවාට තමාගේ නිරීක්ෂණ රූප සටහන්, වියලන ලද මල් කොළ ආදී විවිධ ක්‍රම භාවිතා කරමින් නිදහසේ ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න.
5. නිරීක්ෂණ ඔස්සේ දරුවා තුල පැන නගින ගැටළු විසඳාගැනීමට පොත්, අන්තර්ජාලය, වැඩිහිටියන් සතු දැනුම ආදිය ලබා ගැනීමට සහාය වන්න.
6. දරුවාට අනන්‍ය වූ ආකාරයකට, ඔවුන්ගේ හැකියාව. දක්ෂතා උපයෝගී කරගෙන පරිසර දින පොත නිර්මාණය කිරීම සඳහා උපරිම නිදහස සහ ඉඩ ලබාදෙන්න.
7. දරුවාගේ සිතුවිලි හෝ ප්‍රකාශනවලට බාධා නොකර හැකිතාක් නිවැරදිව භාෂාව, ව්‍යාකරණ, අකුරු භාවිතා කිරීමට උපකාර කරන්න.
8. ව්‍යාපෘති කාලපරිච්ඡේදයේ පළමු සති හය තුළ ළමයෙකුට දිනපොත පිළියල කිරීමේදි යොදාගත හැකි ද්‍රවය (වියළි මල්, කොළ, බීජ, කුරුලු පිහාටු ආදිය) එකතු කිරීම ආරම්භ කළ හැකි අතර ඒවා ආකර්ශනීය සහරාවක් නිර්මාණය කිරීමට යොදා ගැනිමට දරුවා යොමු කරන්න.
9. අත්‍යවශ්‍යම තැන් වලදී පමණක් ඡායාරූප භාවිතා කිරීමට උපදෙස් දෙන්න.
10. දරුවාගේ නිර්මාණශීලීත්වයට සැමවිටම මුල්තැන දෙන්න.
11. සඟරා, පොත්පත්, අන්තර්ජාලය ආදී ප්‍රභවයන් ඔස්සේ ලබාගත් පින්තූර දින පොත සකස් කිරීමට භාවිත නොකරන්න.
12. මාර්ගෝපදේශයක් සඳහා පමණක් ලබා දී ඇති පරිසර දින පොත් ආකෘතිය භාවිතය දරුවාගේ නිර්මාණශීලීත්වයට බාධාවක් නොවන ලෙස භාවිතා කිරීමට යොමු කරන්න. (ඇමුණුම III).

## <u>5.පරිසර දින පොත පිළියෙළ කිරීමේ දී සැලකිය යුතු කරුණු</u>

1. පරිසර දිනපොත දරුවාගේ අත්අකුරින් සැකසිය යුතු අතර පරිගණකයෙන් ටයිප් කිරීමෙන් සකසන ලද වාර්තා පිළිගනු නොලැබේ. දරුවාට ඉතා හොඳින් ලිවීමට නොහැකි නම්, රූප සටහන් භාවිතයෙන් ප්‍රකාශනයට ආධාර ලබාගත හැක.
2. රූප සටහන් යේදීමේදී පැස්ටල්, දිය සායම්, පාට පැන්සල්, ආදි සුදුසු වර්ණ භාවිතා කළ හැක.
3. වාර්තා කිරීමේදී වැඩිහිටියන් විසින් භාවිතා කරන ඉහළ තාක්ෂණික, විද්‍යාත්මක යෙදුම් හෝ භාෂාව භාවිතා කිරීමට දරුවන් පෙලඹවීමෙන් වලකින්න. සරල වචන භාවිතා කර දිනපොත සැකසීමට දරුවන්ට ඉඩදෙන්න.
4. උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති පරිදි පරිසර දින පොතේ පිටු එකතු කරන්න. ඇගැයීම සඳහා ලිහිල් පත්‍රිකා හෝ අක්‍රමවත් ලෙස එකතු කරන ලද පත්‍රිකා සලකා බලනු නොලැබේ.

5. මිල අධික කඩදාසි හෝ ලිපි ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වළකින්න. පැහැදිලි කඩදාසි (සුදු හෝ වර්ණ) අවශ්‍ය පරිදි භාවිතා කරන්න ඉවතලන ද්‍රව්‍ය භාවිතා කර නිර්මාණ කිරීම උනන්දු වන්න.

## 6.වැඩසටහනට ලියාපදිංචි වීම

වැඩසටහනට සහභාගී වීමට කැමැත්තක් දක්වන දරුවන්ට 2024 ජුලි 15වන දිනට පෙර පහත දක්වා ඇති ගූගල් පෝරමය භාවිතා කර වැඩසටහන සඳහා ලියාපදිංචි විය හැක.

ගූගල් පෝරමය භාවිතා කිරීමෙන්

## 7.පරිසර දිනපොත ඉදිරිපත් කිරීම

ජාතික විද්‍යා පදනම වෙබ් පිටුවෙන් බාගත කරන ලද පරිසර දිනපොත පෝරමය නිවැරදි ලෙස පුරවා විදුහල්පතිතුමාගේ සහතිකය සහිතව සම්පූර්ණ කරන ලද පරිසර දින පොත සමග පහත ලිපිනයට යොමු කරන්න.

පෝරමය - https://www.nsf.gov.lk/images/2024/Kid_Naturalist_SIN.pdf

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික විද්‍යා පදනම

47/5, විද්‍යා මාවත

කොළඹ 07

**සැලකිය යුතු:**

- පරිසර දිනපොත එවිය හැකි අවසාන දිනය : 2024/08/31
- ඉදිරිපත් කරන ලද අදාළ පරිසර දින පොත, තරඟයේ ජයග්‍රාහකයින් ජාතික විද්‍යා පදනමේ නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මාස දෙකක් ඇතුළත රජයේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට සවස ප.ව 4.00 දක්වා ජාතික විද්‍යා පදනම් පරිශ්‍රයේදී ලබා ගත හැක.

**වැඩිදුර විස්තර සඳහා :**

අජන්තා මිය/චමරිකා මිය

Tel : 0112696771

Ext : 185